AIA විසින් 2021 වසරේ අලෙවි කරන සෑම ඔප්පුවක් සඳහාම රු. 100 ක් ශ්‍රී ලංකා පිළිකා සංගමයට පරිත්‍යාග කිරීමට පොරොන්දු වෙයි.

# AIA SUWA DIRIYA

## ජීවිතයට නිර්භීතව මුහුණ දෙන්න



AIA ඉන්ෂුවරන්ස්

HEALTHIER, LONGER, BETTER LIVES

සුවපත් සැපවත් ජීවිතයක් දිගු කාලයක් ගත කරන්නට අපි හැම කෙනෙක්ම කැමතියි. අපි හැම දේම කරන්නේ අපේ පවුලේ අයගේ සතුට ආරක්ෂා කර ගැනීමටයි. එනමුත් ඕනෑම අවස්ථාවක දී, ඕනෑම වයසක දී, පෙර දැනුම් දීමකින් තොරව අපේ ජීවිතය කඩා බිඳ දැමීමට අසාධ්‍ය රෝග තත්ත්වයකට පුළුවන්. යම් හෙයකින් ඔබ එවැනි තත්ත්වයකට මුහුණ දුන්නොත් ඔබෙත් ඔබේ පවුලේත් ආර්ථිකයට ඒ මගින් විශාල බලපෑමක් ඇති විය හැකියි.

අසාධ්‍ය රෝග තත්ත්වයන් පුළුල් ව ආවරණය කරනු ලබන AIA සුව දිරිය සැලසුම ඔබ මත පැටවෙන එම අනිසි ආර්ථික බර සැහැල්ලු කරයි. එවැනි මොහොතක ඔබට අවශ්‍ය මූල්‍යමය ශක්තිය අප විසින් ඔබට සපයනු ලබන අතර, ඔබට ඔබේ රෝග තත්ත්වයෙන් මිදීම ගැන සම්පූර්ණ අවධානය යොමු කිරීමටත්, ඔබේ ආදරණීයයන් සමග ආදරයෙන් ජීවිතය ගත කිරීමටත්, අවස්ථාව උදා වනු ඇත.

## AIA සුව දිරිය යනු කුමක් ද?



**පොදුවේ අප මුහුණ දෙන පහත අසාධ්‍ය රෝග* තත්ත්වයන් ආවරණය කරන ජීවිත රක්ෂණ සැලසුමකි.**

- හෘද රෝග
- පිළිකා
- ආඝාතය
- වකුගඩු අකර්මණ්‍ය වීම



**මා හට ඉහත කිසියම් රෝගයක පූර්ව අවධියට මුහුණ දෙන්නට සිදුවුනොත් මෙම ආවරණය මගින් එම තත්ත්වය ආවරණය කෙරෙනවා ද?**

- සුළු හෘද රෝග තත්ත්වයන්/සැත්කම් ගණනාවක්
- පූර්ව පිළිකා තත්ත්වයන්

එමගින් ආවරණය කෙරෙයි.



**ඉහත රෝග තත්ත්වයකට අදාළව මා විසින් හිමිකම් පෑමක් සිදුකළ පසු ඉදිරි වාරිකවලට කුමක් සිදුවේ ද?**

අසාධ්‍ය රෝග තත්ත්වයකට මුහුණ දුන් පසුව නැවත පූර්ණ යථා තත්ත්වයට පත් වීමට කිසියම් කාලයක් ගත වන බව අප හොඳින් වටහා ගත් කරුණකි. අප විසින් මෙම සැලසුම නිර්මාණය කර තිබෙන්නේ එම කාලය අතරතුර ඔබට කිසිම මූල්‍යමය ගැටලුවකට මුහුණ දීමට සිදු නොවන ආකාරයටයි.

- සුළු හෘද රෝග තත්ත්වයන් හා පූර්ව පිළිකා තත්ත්වයන් සඳහා හිමිකම් පෑමක් සිදුකළ පසු ඉදිරි අවුරුදු 3 සඳහා ඔබ වාරික ගෙවිය යුතු නොවේ.
- ඔබ තෝරා ගන්නා අසාධ්‍ය රෝග ආවරණ පැකේජය අනුව බරපතළ හෘද රෝග, බරපතළ පිළිකා රෝග, ආඝාතය හා වකුගඩු අකර්මණ්‍ය වීමකදී හිමිකම් පෑමක් සිදුකළ පසු රක්ෂණ කාල සීමාව අවසානය දක්වාම ඔබ වාරික ගෙවිය යුතු නොවේ.



**බරපතළ රෝග තත්ත්වයක් හේතුවෙන් මා විසින් හිමිකම් පෑමක් සිදුකළ පසු මගේ ඔප්පුවට සිදුවන්නේ කුමක් ද?**

ඔබ හිමිකම්පෑම සිදුකරන රෝගාබාධ තත්ත්වයට අනුව අදාළ ප්‍රතිලාභ මුදල ඔබට හිමිවනු ඇත. තවද බරපතළ රෝග තත්ත්වයෙන් මිදී යථා තත්ත්වයට පැමිණීමේදී අනපේක්ෂිත වියදම් බොහොමයකට මුහුණ දීමට ඔබට සිදුවන නිසා නැවත යථා තත්ත්වයට පත්වීම සඳහා **සුවපත් වීමේ ප්‍රතිලාභය** (Recovery Benefit) ඔබට හිමි වේ.

- බරපතළ හෘද රෝග තත්ත්වයක දී, බරපතළ පිළිකා තත්ත්වයක දී, ආඝාතයකදී හෝ වකුගඩු අකර්මණ්‍ය වීමක දී සිදු වන හිමිකම් ගෙවීමට අමතරව වසර 5ක් පුරාවට ඔබේ අසාධ්‍ය රෝග ප්‍රතිලාභ වටිනාකමින් 1%ක් මාසිකව හිමි වේ.

### මා හට හිමිකම් පෑමේ අවශ්‍යතාවයක් නොවූ විට සිදුවන්නේ කුමක් ද?

AIA සුව දිරිය සමග ලබාදෙන හිමිකම් නොපෑමේ ප්‍රතිලාභය (No Claim Privilege) නිසා ඔබගේ ප්‍රතිලාභ වටිනාකම වැඩි වේ.

- ඔබ රක්‍ෂණ හිමිකම් පෑමක් සිදුනොකරන තෙක් සෑම වසරක් පාසා ඔබේ අසාධ්‍ය රෝග ප්‍රතිලාභය හා ජීවිත ප්‍රතිලාභය 10% කින් වැඩි වේ. ආරම්භක ප්‍රතිලාභ වටිනාකම මෙන් 150%ක් වූ උපරිමයක් දක්වා හෝ ඔබ හිමිකම් පෑමක් සිදුකරන අවස්ථාවක් දක්වා මෙම වැඩිවීම සිදු වේ.

### මා අනපේක්ෂිත ලෙස වියෝවුවහොත් සිදුවන්නේ කුමක් ද?

- මෙම ආවරණය මගින් ඔබ අවාසනාවන්ත ලෙස වියෝවුවහොත් ඔබ තෝරා ගත් ජීවිත ප්‍රතිලාභය ආදරණීයයන් වෙත හිමි වේ. ඔබේ රක්‍ෂණ අවශ්‍යතාවයට අනුව ජීවිත ප්‍රතිලාභ වටිනාකම තෝරා ගැනීමේ හැකියාව ද ඔබට ඇත.

### ඔප්පු කාල සීමාව අවසන් වූ විට මට ලැබෙන්නේ මොනවාද?

- මෙය සම්පූර්ණයෙන්ම සුරක්ෂිතතාව මූලික කොට ගත් සැලසුමක් නිසා ඔබ වාරික ගෙවනු ලබන්නේ ජීවිතාවරණය සහ අසාධ්‍ය රෝග ආවරණය සඳහා පමණි. එබැවින් කල්පිරීමේ ප්‍රතිලාභයක් මෙම සැලසුම සමග හිමි නොවේ. ඒ කෙසේ නමුත් ඔබ මේ සැලසුම සමග 'ගෙවූ වාරික නැවත ලබාදීමේ විශේෂාංගය*' (Returning of Premium Paid Option) ලබාගෙන ඇත්නම් සහ ඔප්පු කාල සීමාව ඇතුළත කිසිම ආකාරයක හිමිකම් පෑමක් සිදුකර නැත්නම්, ඔබ ගෙවූ වාරික නැවත ලබා ගැනීමේ හැකියාව ඔබට හිමි වේ.

## මෙම සැලසුම මිල දී ගන්නේ කෙසේ ද?

ඔබේ අවශ්‍යතාවයට අනුව අසාධ්‍ය රෝග ආවරණ පැකේජ 4කින් ඔබට තෝරා ගත හැකිය.

**1 වැනි පැකේජය** - ජීවිත ප්‍රතිලාභය + පිළිකා ආවරණය
**2 වැනි පැකේජය** - ජීවිත ප්‍රතිලාභය + හෘද රෝග ආවරණය
**3 වැනි පැකේජය** - ජීවිත ප්‍රතිලාභය + පිළිකා ආවරණය + හෘද රෝග ආවරණය
**4 වැනි පැකේජය** - ජීවිත ප්‍රතිලාභය + පිළිකා ආවරණය + හෘද රෝග ආවරණය + ආඝාතය + වකුගඩු අකර්මණ්‍ය වීම

ඔබේ අවශ්‍යතාවට ගැලපෙන පරිදි අසාධ්‍ය රෝග ආවරණය සහ ජීවිතාවරණය ඔබට තෝරා ගත හැකිය. ඔබ තෝරා ගන්නා පැකේජය සඳහා කොපමණ වාරිකයක් ඔබ විසින් ගෙවිය යුතු ද යන්න අපි නිදර්ශනයක් ඇසුරෙන් තේරුම් ගනිමු. මෙහි වාරික අගය සටහන් කර ඇත්තේ 'ගෙවූ වාරික නැවත ලබාදීමේ විශේෂාංගය' (Returning of Premium Paid Option) ලබා ගැනීම සැලකිල්ලට නොගෙනය.

- ඔබ වයස අවුරුදු 35ක් වූ පිරිමි අයෙකු නම් (2019 අගෝස්තු මාසයට ඊළඟ උපන් දිනය යෙදෙයි)

| පැකේජය | ඔප්පු කාලසීමාව | අසාධ්‍ය රෝග ප්‍රතිලාභය (රු. වලින්) | ජීවිත ප්‍රතිලාභය (රු. වලින්) | වාර්ෂික වාරිකය (රු. වලින්) |
|---|---|---|---|---|
| පිළිකා ආවරණය | වසර 10 | 2,000,000 | 2,000,000 | 13,140 |
| හෘද රෝග ආවරණය | වසර 10 | 2,000,000 | 2,000,000 | 19,040 |
| හෘද රෝග ආවරණය + පිළිකා ආවරණය | වසර 10 | 2,000,000 | 2,000,000 | 26,120 |
| හෘද රෝග ආවරණය + පිළිකා ආවරණය + ආඝාතය + වකුගඩු අකර්මණ්‍ය වීම | වසර 10 | 2,000,000 | 2,000,000 | 30,980 |

## අසාධ්‍ය රෝග ප්‍රතිලාභ හිමිකම් පෑමකින් පසු සිදු වන්නේ කුමක් ද?

බරපතළ හෘද රෝග තත්ත්වයක දී, බරපතළ පිළිකා තත්ත්වයක දී, ආඝාතයකදී හෝ වකුගඩු අකර්මණ්‍ය වීමක දී අසාධ්‍ය රෝග ප්‍රතිලාභ සඳහා හිමිකම් පෑමක් සිදුකළ හොත් එතැන් සිට අසාධ්‍ය රෝග ප්‍රතිලාභ ආවරණය ක්‍රියාත්මක නොවන අතර ජීවිත ප්‍රතිලාභය ඔප්පු කාලසීමාව අවසානය දක්වා ඔබට හිමි වෙයි.

## අසාධ්‍ය රෝග තත්ත්වයක දී, මම ප්‍රතිලාභ හිමි කර ගන්නේ කෙසේ ද?

2 වැනි පැකේජය (හෘද රෝග ආවරණය) ලබා ගැනීමේ දී ප්‍රතිලාභ හිමි වන ආකාරය පහත නිරූපණය මගින් දැක්වේ.

**2 වැනි පැකේජය (හෘද රෝග ආවරණය)**
**අසාධ්‍ය රෝග ප්‍රතිලාභය රු. 2,000,000**
**ජීවිත ප්‍රතිලාභය රු. 1,000,000**

**රෝග අවස්ථාව**

**ඇන්ජියෝප්ලාස්ටි (Angioplasty) සැත්කමක්** (සුළු හෘද රෝග තත්ත්වයක්) → **බයිපාස් (Bypass)** (බරපතළ හෘද රෝග තත්ත්වයක්) → **සුවපත් වීමේ ප්‍රතිලාභය (Recovery Benefit)** (බරපතළ හෘද රෝග තත්ත්වයක් සඳහා හිමිකම් පෑමකදී)

**ඔබට හිමි වන ප්‍රතිලාභය**

**නියමිත හිමිකම් මුදල: රු. 500,000** ඊළඟ වසර 3 සඳහා වාරික ගෙවීම අවශ්‍ය නොවේ
+
**නියමිත හිමිකම් මුදල: රු. 1,500,000** ඔප්පු කාල සීමාවේ අවසානය දක්වා වාරික ගෙවීම අවශ්‍ය නොවේ
+
**නියමිත හිමිකම් මුදල: රු. 1,200,000** මසකට රු. 20,000 බැගින් (අසාධ්‍ය රෝග ප්‍රතිලාභ මුදලින් 1% ක්) මාස 60ක් පුරාවට
=
**මුළු ප්‍රතිලාභ වටිනාකම: රු. 3,200,000**

ජීවිත ආවරණය ඔප්පුව කල්පිරීම තෙක් ක්‍රියාත්මකයි

## මෙම ඔප්පුවට අදාළ තවත් වැදගත් තොරතුරු

**වයස් සීමාව**

වයස අවුරුදු 19 සිට 60 දක්වා (මීළඟ උපන් දිනයට)

**ඔප්පු කාල සීමාව**

- අවම ඔප්පු කාල සීමාව - වසර 10කි
- උපරිම ඔප්පු කාල සීමාව - 1 වැනි පැකේජය - වසර 30කි
  2 වැනි, 3 වැනි, 4 වැනි පැකේජ - වසර 20කි

**අසාධ්‍ය රෝග ප්‍රතිලාභ සීමාව**

- අවම - රු. 500,000
- උපරිම - රු. 4,000,000

**ජීවිතාවරණ ප්‍රතිලාභ සීමාව**

- අවම - අසාධ්‍ය රෝග ප්‍රතිලාභ සීමාවෙන් 25% ක්
- උපරිම - අසාධ්‍ය රෝග ප්‍රතිලාභය මෙන් 200% ක්

**වාරික ගෙවීමේ මාදිලිය**

- වාර්ෂික හා අර්ධ වාර්ෂික

AIA සුව දිරිය සැලසුමේ මූලික අරමුණ වන්නේ තෝරා ගත් අසාධ්‍ය රෝග තත්ත්වයන් සඳහා රැකවරණය හා ජීවිත රැකවරණය සැලසීමයි. එබැවින් රක්‍ෂණ කාල සීමාව අවසානයේ කල්පිරීමේ ප්‍රතිලාභයක් AIA සුව දිරිය සැලසුම මගින් හිමි නොවේ. කෙසේ නමුත් ‘ගෙවූ වාරික නැවත ලබා දීමේ විශේෂාංගය’ (Returning of Premium Paid Option) ලබා ගෙන ඇත්නම් ගෙවා ඇති මුළු වාරික අගය කල් පිරීමේදී ලබා ගත හැක. නමුත් එසේ කළ හැක්කේ රක්‍ෂණ කාල සීමාව අතරතුර කිසිදු හිමිකම් පෑමක් සිදුකර නැත්නම් පමණි.

*මෙම රක්‍ෂණ සැලසුම මගින් ආවරණය කෙරෙන අසාධ්‍ය රෝග තත්ත්වයන් පිළිබඳ නිර්වචනයන් හා සම්පූර්ණ තොරතුරු දැන ගැනීම සඳහා රක්‍ෂණ ඔප්පුව බලන්න.

*ඔප්පු කාලසීමාව තුළ අදාළ වාරික ගෙවීම සිදුකිරීම පැහැර හැර ඇති අවස්ථාවක ඔප්පුව අප්‍රාණික වේ. ‘ගෙවූ වාරික නැවත ලබාදීමේ විශේෂාංගය’ (Returning of Premium Paid Option) ලබා ගෙන ඇත්නම් සහ කිසිදු හිමිකම් පෑමක් සිදුකර නොමැති අවස්ථාවක ඔප්පුව කල් ඉකුත් වීමට පෙර දැනට වාරික ගෙවා ඇති ප්‍රමාණයෙන් 0% සිට 90% දක්වා කොටසක් පවාරණ අගයක් වශයෙන් ලබා ගත හැක. වැඩි විස්තර සඳහා රක්‍ෂණ ඔප්පුව බලන්න.

**නීතිරීති හා කොන්දේසි:**

ජීවිත රක්ෂිතයා රක්ෂණවර හිමියා නොවන්නේ නම් මෙම රක්ෂණවරය මගින් සපයනු ලබන ප්‍රතිලාභ රක්ෂණවර හිමියා වෙත අදාළ වන අතර, ආවරණයන් ජීවිත රක්ෂිතයා වෙත අදාළ වේ.

සැලසුම ආරම්භ වූ දිනයේ සිට දින 180ක් දක්වා වන කාලසීමාව තුළ (පොරොත්තු කාලය) අසාධ්‍ය රෝග ප්‍රතිලාභ හිමිකම් ලබාගැනීමට නොහැකිය. නමුත් ජීවිතාවරණයට හිමිකම් ලබාදීම ජීවිත රක්‍ෂණ ඔප්පුව ඇරඹූ දා පටන් සක්‍රීය වේ.

මෙම සැලසුම ලබා ගත හැකි වන්නේ බලපත්‍රලත් AIA වෙල්ත් ප්ලෑනර්වරයෙකුගෙන් හෝ මූල්‍ය සැලසුම් නිලධාරියෙකුගෙන් හෝ අවසරලත් බ්‍රෝකර්වරයෙකුගෙන් පමණි.

මෙය සැලසුම පිළිබඳ දළ විස්තරයක් පමණි. සම්පූර්ණ සැලසුම් විස්තර සහ නීතිරීති හා කොන්දේසි සඳහා කරුණාකර රක්ෂණවර ඔප්පුව බලන්න.

AIA Insurance Lanka Limited (Co.No.PQ 18 PB) විසින් නිකුත් කරන ලදී. 06/29/2021

HEALTHIER, LONGER,
BETTER LIVES